## සාමාන්‍ය සමය තිස්දෙවන ඉරුදින | දේව ප්‍රකාශන

09-11-14

## පළමුවන දේව ප්‍රකාශනය

ප්‍රඥා 6:12-16

සලමොන්ගේ ප්‍රඥාව නම් පොතෙන් ගත් පාඨයෙකි.

**"ප්‍රඥාව සොයන්නාට එය සම්භ වේ."**

ප්‍රඥාව දීප්තිමත් ය. ඇය මලානික නොවේ. ඇයට ප්‍රේම කරන අයට ඇය හොඳින් පෙනේ. ඇය සොයන අය ඇය ලබාගනු ඇත. තමාට ආශා කරන අය ගැන ඇය කලින් දැනගෙන ඔවුන්ට ප්‍රකාශ වනු ඇත. ඇය එන තෙක් වේලාසනින් බලා සිටින්න. ඔබට කරදරයක් නොවනු ඇත. ඔබේ දොරටු ළඟ ඇය සිටිනු ඔබට හමු වේ. ඇය ගැන සිතීම පවා අංග සම්පූර්ණ දැනීමක් ලැබීම ය. ඇය ගැන පරීක්ෂාකාරී ව සිටින්න. එවිට, විශස, කරදර ඔබෙන් දුරුවනු ඇත. ඇය ලබාගැනීමට සුදුසු අය සොයමින් ඇය සැරිසරනු ඇත. ඔවුන්ගේ මාර්ගවල දී විනීත ලෙස මුණගැසී ඔවුන්ගේ සිත්සතන් තුළ ප්‍රකාශ වනු ඇත.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 63:1-7

පිළිතුර: සමිඳුනි, මාගේ දෙවිඳුනි, මාගේ ආත්මය ඔබ කෙරෙහි පිපාසයෙන් පෙළෙන්නේ ය.

ගීය: දෙවිඳුනි, මාගේ දෙවිඳුනි, ඇඩි ආශාවෙන් මම ඔබ සොයන්නෙමි. මා හද ඉතා ගිජු ලෙස ඔබ කෙරෙහි පිපාසයෙන් පෙළෙන්නේ ය. වියළි බිම ජලයට පිපාසා වන පරිදි මම ඉතා ආශාවෙන් ඔබ වෙත ඇදී යන්නෙමි.

ඔබේ ශුද්ධස්ථානයේ දී මම ඔබ දෙස ඕනෑකමින් බලා සිටින්නෙමි. ඔබේ බලය ද මහිමාලංකාරය ද නරඹන්නෙමි. ඔබේ තිර පෙම මාගේ ජීවිතයටත් වඩා මට අගනේ ය; මාගේ මුව ඔබට ප්‍රශංසා කරන්නේ ය.

මුළු ජීවිතයේ දී ම මම ඔබට ප්‍රශංසා කරන්නෙමි; ඔබේ නාමයෙන් අයැදිමින් මම ඔබ දෙසට දෑත නගන්නෙමි. රස මස්'වුලින් මෙන් මම සෑහීමට පත් වන්නෙමි; මා මුවින් තුති ගී ගයා මම ඔබ පසසන්නෙමි.

යහනේදීත් මම ඔබ ගැන සිතන්නෙමි; රෑ යාමවල දී ඔබ ගැන මෙනෙහි කරන්නෙමි. මන්ද, ඔබ වහන්සේ මාගේ ආධාරය වූ සේක. ඔබේ පියාපත් සෙවණෙහි මම ප්‍රීති වන්නෙමි.

## දෙවන දේව ප්‍රකාශනය

1 තෙසලෝනික 4:13-18

පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමු වන හසුනෙන් කොටසකි.

**"ස්වාමින් වහන්සේ තුළ පරලෝ සැපත් වූ අය දෙවියන් වහන්සේ නැවත ගෙනෙන සේක."**

සහෝදරවරුනි, මතු බලාපොරොත්තුවක් නැති සෙසු අය මෙන් ඔබ ශෝක නොවන පිණිස, මියගියවුන් ගැන ඔබ නොදන සිටීම කිසිසේත් අපගේ කැමැත්ත නොවේ. ජේසුස් වහන්සේ නැසී නැවත උත්ථාන වූ සේකැ යි අපි අදහමු: එසේ ම, ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාස කරමින් උන් වහන්සේ තුළ සැතපුණු අය, උන් වහන්සේ මඟින් දෙවියන් වහන්සේ නැවත ගෙනෙන සේකැ යි ද අදහමු.

(අප දැන් ඔබට කියන්නේ සමිඳුණන් වහන්සේ ම වදාළ කරුණකි. එනම්: සමිඳුණන් වහන්සේගේ ආගමනයේ දී ජීවත් ව සිටින අපට, උන් වහන්සේ තුළ සැතපුණු අයට

නොමැති විශේෂ වාසියක් නැති බව ය. මන්ද, සමිඳාණන් වහන්සේ ම අණ දීමේ ශබ්දය ද, අග්‍ර දේව දූතයෙකුගේ හඬ ද, දෙවියන් වහන්සේගේ හොරණෑ නාදය ද ඇතිව ස්වර්ගයෙන් බැස වදාරන සේක. ක්‍රිස්තුන් වහන්සේ අදහමින් උන් වහන්සේ තුළ සැතපුණු අය පළමුකොට නැඟිටින්නෝ ය. එවිට ජීවතුන් අතර සිටින අපි, ඔවුන් සමඟ සමිඳාණන් වහන්සේ හමු වන පිණිස, වලාකුළුවලින් අහසට ඔසවාගනු ලබන්නෙමු. මෙසේ අපි නිතර ම සමිඳාණන් වහන්සේ සමඟ සිටින්නෙමු. එහෙයින් මේ වචනවලින් එකිනෙකා සනසන්න.)

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## සුපුවත් ජය නද

මතෙව් 25:42,44

ආලේලූයා! ආලේලූයා

> අවදි ව ඉන්න. සූදානම් ව සිටින්න. කුමක් නිසාද ඔබ බලාපොරොත්තු නොවන පැයක දී මනුෂ්‍ය-පුත්‍රයාණෝ වඩින සේක.

ආලේලූයා!

## ශුද්ධවූ සුවිශේෂය

මතෙව් 25:1-13

මතෙව් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**"අන්න, මනාලයා! ඔහු පෙරමඟට යන්න."**

"ස්වර්ග රාජ්‍යය මෙසේ උපමා කළ හැකි ය. තෙල් පහන් රැගෙන මනාලයා පෙරමඟට යුවතියෝ දස දෙනෙක් ගියෝ ය. ඔවුන් අතරෙන් පස් දෙනෙක් නුවණ නැති අය ය; පස් දෙනෙක් නුවණ ඇති අය ය. නුවණ නැති අය සිය පහන් ගෙන යද්දී ඒ සමඟ තෙල් ගෙන ගියේ නැත. එහෙත්, නුවණ ඇති අය සිය පහන් ගෙන යද්දී ඒ සමඟ බඳුන්හි තෙල් ගෙන ගියහ. මනාලයාගේ පැමිණීම පමා වූ කල ඒ සියල්ලෝ ම නිදිබර වී නිදාගත්හ. "මධ්‍යම රාත්‍රියේ 'අන්න, මනාලයා! ඔහු පෙරමඟට යන්නැ'යි හඬක් විය. එවිට ඒ සියලු යුවතියෝ නැඟිට සිය පහන්වල තිර සකස් කළහ. 8එකල නුවණ නැති අය, 'අපේ පහන් නිවීගන යයි, ඔබගේ තෙල්වලින් ටිකක් අපට දෙන්නැ'යි නුවණ ඇති අයට කී හ. එහෙත්, නුවණ ඇති අය, 'එසේ කළ නොහැක; අප දෙගොල්ලන්ට ම සෑහෙන තරම් තෙල් මෙහි නැත; එබැවින් වෙළෙඳුන් වෙත ගොස් ඔබ ම මිල දී තෙල් ගන්නැ'යි පිළිතුරු දුන්හ. ඔවුන් ගිය පසු මනාලයා ආවේ ය; සූදානම් ව සිටි පස් දෙනා ඔහු හා සමඟ මංගලෝත්සවයට ගියහ. ඔවුන් ඇතුළු වූ විට දොර වසන ලදී. "පසුව අනිත් යුවතියෝ අවුත්, 'ස්වාමීනි, ස්වාමීනි, අපට දොර ඇරිය මැනවැ'යි කී හ. එහෙත් මනාලයා 'මම ඔබ කිසි සේත් නොහඳුනම්'යි පිළිතුරු දුන්නේ ය. එබැවින් දවස වත්, පැය වත් ඔබ නොදන්න නිසා අවදි ව ඉන්න."

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.